**කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ සහ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ රියදුරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම.**

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ සහ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින රියදුරු තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. තනතුර : ඒකාබද්ධ සේවයේ රියදුරු තනතුර (ස්ථිර විශ්‍රාම වැටුප් සහිත)

02. වැටුප් කාණ්ඩය : PL 3 – 2006

03. වැටුප් පරිමාණය : රු.25790 - 270×10 - 300×10 - 330×10 - 350×12 - 38990/-

04. තනතුරු සංඛ්‍යාව : නවයකි (09)

05. සුදුසුකම් :

I. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

II. තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

III. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.

IV. පෞද්ගලික / කුලී රථ සහ තාර බර හොන්ඩර 24 ට අඩු ස්වේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන නිපුණතාව පිළිබඳ සහතිකය ලබා තිබිය යුතුය. බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අදාල සහතිකය ලබා තිබිය යුතුය. (වාහන පන්ති C හා $C_1$)

V. වාහන රියදුරෙකු ලෙස වසර තුනක (03) පළපුරුද්ද තිබිය යුතුය. (සහතික මඟින් සනාථ කළ යුතුය.)

VI. අවම උස අඩි 05 ක් විය යුතුය.

VII. දිවා කාලයේ සහ රාත්‍රී කාලයේදී සේවයෙහි යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීම තිබිය යුතුයි. (රජයේ වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් විධිමත් වෛද්‍ය සහතිකය ඉදිරිපත් කළ යුතුය. - සෞඛ්‍ය 307 ආකෘතිය මඟින්)

VIII. මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

06. බඳවා ගන්නා ක්‍රමය : සුදුසුකම් සපුරාලන්නන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකින් හා වෘත්තීය පරීක්ෂණයක් මඟින් තෝරා ගනී.

I. සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් අධ්‍යාපනික සහතික හා වෘත්තීය සුදුසුකම් සනාථ කළ හැකි **සහතික පිටපත් සමඟ** අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

II. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් පස කෙළවරේ "**රියදුරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම**" ලෙස සඳහන් කළ යුතුය.

**III.** සියලුම අයදුම්පත් 2019.05.31 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලේකම්, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අදාල බඳවා ගැනීමේ බලධරයා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසුකමක් සේ සලකනු ලැබේ.

ලේකම්
කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත්
සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත්
සංවර්ධන අමාත්‍යාංශය

2019 මැයි 15 දින
ලේකම්
කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන,
වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නව මහ ලේකම් කාර්යාලය
කොළඹ 10